## (ඊ) රජයේ මුදල් පරිහරණය

**1959–60 මුදල් වර්ෂය**

1959/60 මුදල් වර්ෂය සඳහා ලංකාණ්ඩුවේ ගිණුම්, ඊට පෙර වර්ෂයන් සඳහා අනුරූප තොරතුරු ද ඇතුලත්ව, 66 පිටේ ඇති II–42 සංඛ්‍යා සටහනේ සංක්ෂේපයෙන් දැක්වේ. මේ සංඛ්‍යා සටහනේ දක්වා ඇති පරිදි රජයේ අය වැය ලේඛන ගනුදෙනුවල ප්‍රධාන ලක්ෂණය මෙසේය.

(අ) 1959/60 මුදල් වර්ෂය තුල රජයේ මුළු ආදයම රුපියල් කෝටි 140·38 ක් විය. මෙය 1958/59 දී රුපියල් කෝටි 133·04 ක් ද, 1957/58 දී රුපියල් කෝටි 128·00 ක් ද විය.

(ආ) 1959/60 මුළු සම්මත වියදම රුපියල් කෝටි 182·00 ක් විය. මෙය 1958/59 දී රුපියල් කෝටි 173·80 ක් ද 1957/58 දී රුපියල් කෝටි 156·57 ක් ද විය. සම්මත වියදම පිළිබඳ මේ සංඛ්‍යාවලින් නිදන් අරමුදල් දායක දීමනා සඳහා ද පොත් ගැලපීම් ද ඉවත් කොට ඇත. 1959/60 සංඛ්‍යාවලින් මහ බැංකුවෙන් ලබා ගත් විශෙෂ ණය මුදලකින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ගෙවූ රු. 3·70 ක සහභාග දීමනාව ද ඉවත් කොට ඇත.

(ඇ) අත්තිකාරම් ගිණුම් මෙහෙයුම් සම්බන්ධව රුපියල් කෝටි 0·13 ක ශුද්ධ ගෙවීමක් සිදු විය. මේ සම්බන්ධව 1958/59 රුපියල් කෝටි 0·58 ක ශුද්ධ ගෙවීමක් ද 1957/58 රුපියල් කෝටි 6·34 ක ශුද්ධ ලැබීමක් ද විය.

(ඈ) මේ ආදයම් සහ වියදම් අනුව 1959/60 මුදල් වර්ෂයේ රජයට රුපියල් කෝටි 41·75 ක ශුද්ධ අය වැය හිඟයක් විය. 1958/59 ඇති වූ රුපියල් කෝටි 41·34 ශුද්ධ හිඟය ද, 1957/58 ඇති වූ රුපියල් කෝටි 22·23 ක ශුද්ධ හිඟය ද මේ හා සැසඳේ.

1959/60 නියම වශයෙන් ඇති වූ රුපියල් කෝටි 41·75 ක ශුද්ධ අය වැය හිඟය එම වර්ෂය සඳහා මුල් අය වැය ඇස්තමේන්තුවලින් අපේක්ෂා කළ හිඟයට රුපියල් කෝටි 4·96 කින් අධික විය. එහෙත් 1958/59 දී වූ රුපියල් කෝටි 41·34 ක නියම හිඟය එම වර්ෂයේ මුල් ඇස්තමේන්තුවලින් දැක්වුන හිඟයට රුපියල් කෝටි 8·26 කින් අඩු විය. 1959/60 නියම හිඟයත්, අය වැය ලේඛනයෙන් අපේක්ෂා කළ හිඟයත් අතර වෙනස ඇති වූයේ "ආදයමට අයවෙන වියදම" රුපියල් කෝටි 13·98 කින් මුල් ඇස්තමේන්තුවට අධිකවීමත් "ණය අරමුදල්වලට අය වෙන වියදම" මුල් ඇස්තමේන්තුවට රුපියල් කෝටි 6·27 කින් අඩුවීමත් නියම ආදයම කෝටි 2·93 කින් මුල් ඇස්තමේන්තුවට අධිකවීමත් හේතු කොට ගෙනය.

**ආදයම**

රුපියල් කෝටි 140·38 ක් වූ 1959/60 නියම මුළු ආදයම, 1958/59 නියම මුළු ආදයමට රුපියල් කෝටි 7·34 කින් වැඩි විය. ආයාත තීරු බදුවලින් ලැබුනු ආදයම පෙර වර්ෂයේ එම මාර්ගයෙන් ලැබුනු ආදයමට රුපියල් කෝටි 4·0 කින් වැඩි විය. මෙ වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ 1959/60 අය වැය ලේඛනයෙන් පනවන ලද තීරු බදු වැඩිකිරීමය. 1959/60 මුදල් වර්ෂය අවසානයට ලඟාවෙත්ම එනම්, 1960 අගෝස්තු මාසයේ දී සමහර ආයාත භාණ්ඩයන් පිළිබඳ තීරු බදු සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩි කරන ලදී. එහෙත් ඒ වැඩිකිරීම් එම මුදල් වර්ෂයේ ආදයම කෙරෙහි ප්‍රමාණවත් ලෙස බලපෑවේ නොවේ.

තේ වෙළෙඳ බද්දත්, රබර් නිර්යාත ගාස්තුවෙන්* ලැබුනු ආදයම ඇතුළුව මුළු නිර්යාත බදු ආදයම රුපියල් කෝටි 32·60 ක් විය. 1958/59 මෙම මාර්ගයෙන් ලැබුනු ආදයම ද දළ වශයෙන් මෙම ප්‍රමාණයටම විය. තේ නිර්යාතයෙන් ලැබුනු ආදයම 1958/59 යේ ලැබුනු ආදයමට රුපියල් කෝටි 4·0 කින් අඩු විය. එහෙත් රබර් සහ පොල් නිෂ්පාදිතයන්ගෙන් ලැබුනු ආදයම පිළිවෙලින් රුපියල් කෝටි 3·60 කින් හා රුපියල් කෝටි 1·0 කින් වැඩි විය. 1959 සැප්තැම්බර් 9 වැනිද රාත්තලකට සත 20 සිට සත 28 දක්වා ද, 1959 නොවැම්බර් 11 වැනිද සත 28 සිට සත 38 දක්වා ද 1959/60 අය වැය ලේඛනය ඉදිරිපත් කිරීමෙන් පසුව රබර් නිර්යාත බද්ද දෙ වරක් වැඩි කරන ලදී. 1959/60 අය

---

*1959 නොවැම්බර් 11 වැනිද රබර් නිර්යාත බද්ද රාත්තලකට සත 10 කින් වැඩි කරන ලදී. මෙම බදු වැඩිකිරීම අනුමත කිරීමට පළමුව පාර්ලිමේන්තුව විසුරුවා හැරියෙන් එය සමාන නිර්යාත බලපත්‍ර ගාස්තුවකට පෙරළන ලදී.

වැය ලේඛනයෙන් පොල් නිෂ්පාදිත පිළිබඳ නිර්යාත බදු වැඩි කරන ලදී. තේ හා රබර් නිර්යාත පරිමාව 1958/59 වඩා වැඩි වූ අතර, පොල් නිෂ්පාදිත නිර්යාත පරිමාව අඩු විය.

1959 ජුනි මස තේ නිර්යාත බදු සම්බන්ධව කැරුණු ප්‍රතිශෝධනයේ ප්‍රතිඵලයක් වශයෙන් ඇති වූ බදු බර අඩුවීම නිසා මේ මාර්ගයෙන් ලැබුණු ආදායම අඩු විය. නමුත්, තේ නිර්යාත පරිමාව වැඩිවීම නිසා මෙය තරමක් දුරට සම හන් විය. කුඩා තේ වතු හිමියන්ගේ සහනදායක ක්‍රමය යටතේ 1958/59 දී දෙන ලද රුපියල් කෝටි 2·25 සහනාධාරය අඩු කළ විට, 1958/59 දී 1959/60 අතර තේ නිර්යාත බදුවලින් දෙන ලද ශුද්ධ ආදායම අඩු වූයේ, රුපියල් කෝටි 1·75 කින් පමණකි. 1959 ජුනි මාසයේ තේ නිර්යාත බදු ප්‍රතිශෝධනයත් සමගම සුළු තේ වතු හිමියන් සඳහා වූ සහනදායක ක්‍රමය අහෝසි කැරිණ.

දේශීය භාණ්ඩ බදුවලින් (තේ වෙළෙඳ බද්ද හැර) ලැබුනු ආදායම 1958/59 එම මාර්ගයෙන් ලැබුනු ආදායමට රුපියල් කෝටි 2·83 කින් වැඩි විය. ආදායම් බද්දෙන් ලැබුනු ආදායම රුපියල් කෝටි 0·5 කින් අඩු විය. පුද්ගලික වස්තු, ත්‍යාග සහ වියදම් බදුවලින් ලැබුනේ රුපියල් කෝටි 0·12 ක් පමණි. මේ පිළිබඳ මුල් ඇස්තමේන්තුව රුපියල් කෝටි 1·50 ක් විය.

දුම්රිය දෙපාර්තමේන්තුවේ සහ විදුලි බල දෙපාර්තමේන්තුවේ වැඩිවෙමින් පැවැති දළ ආදායම මේ වර්ෂයේ ද වැඩි විය. දුම්රිය දෙපාර්තමේන්තුවේ දළ ආදායම රුපියල් කෝටි 8·15 සිට රුපියල් කෝටි 8·54 දක්වා වැඩි වූ අතර, විදුලි බල දෙපාර්තමේන්තුවේ දළ ආදායම රුපියල් කෝටි 2·37 සිට රුපියල් කෝටි 2·47 දක්වා වැඩි විය.

සටහන II—41

**ලංකාණ්ඩුවේ වියදම**

(රුපියල් අශ ලක්ෂ)

| වර්ෂය | ජංගම වියදම | ප්‍රාග් ධන වියදම් (1) (2) | | |
|---|---|---|---|---|
| | | මූර්ත වත්කම් අත්කර ගැනීම, ගොඩ නැගීම සහ පවත්වා ගෙන යාම | රාජ්‍ය ව්‍යවසාය වලට ණය | එකතුව |
| 1957–58 .. .. .. .. .. .. | 1,118·2 | 422·3 | 76·3 | 498·6 |
| 1958–59 .. .. .. .. .. .. | 1,274·4 | 443·2 | 49·8 | 493·0 |
| 1959–60 (මුල් ඇස්තමේන්තු).. .. .. | 1,271·0 | 546·3 | — | 546·3 |
| නියම (තාවකාලික) .. .. .. .. | 1,361·9 | 469·7 | 56·1 | 525·8 |
| 1960–61 (මුල් ඇස්තමේන්තු).. .. .. | 1,464·0 | 503·5 | 19·4 | 522·9 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

(1) ප්‍රාග් ධන වියදම් ලෙස සැලකේන්නේ, අවුරුද්දකට වඩා වැඩි කාලයක ප්‍රයෝජනය සඳහා පවතින වත්කම්, නිර්මාණය ලබා ගැනීම හා පවත්වා ගෙන යාම සඳහා යන වියදම් සහ, මූල්‍ය වත්කම් අත්කර ගැනීමේ වියදම්ය. මෙයට ප්‍රධාන වශයෙන් ලං.ග.ම.යට හා වරාය සංයුක්ත මණ්ඩලය (ප්‍රාග් ධන කාර්යයන් සඳහා) හා කෘෂිකාර්මික හා කාර්මික ණය දෙන සමායතනය (සංවර්ධන ණය අරමුදල) ආදියට දෙන ලද ණය මුදල් ගැනේ. සංවර්ධනයට නො ගැනෙන ප්‍රාග් ධන වියදම් ඇතුලත් වන නිසාත්, සංවර්ධනයට නැගෙන සමහර වියදම් ඇතුලත්වන නිසාත් ප්‍රාග් ධන වියදම් සංවර්ධන වියදම් හා සැසැඳෙන්නේ නොවේ.

(2) අතිරේක අය–වැය පැහැදම් ඇතුලත් වෙයි.

**වර්තන වියදම**

1958/59 සිට 1960/61 දක්වා මුදල් වර්ෂයන්හි වර්තන සහ ප්‍රාග් ධන වියදම් පිළිබඳ සංසන්දිත සංඛ්‍යා ඉහත සංඛ්‍යා සටහනෙහි දක්වේ. 1958/59 හා සැසඳූ විට 1959/60 වර්තන වියදම රුපියල් කෝටි 8·70 ක වැඩිවීමක් දක්වයි. දැනට ලබා ගත හැකි සංඛ්‍යා තොරතුරු අනුව මේ වැඩිවීම ප්‍රධාන වශයෙන් සිදු වී ඇත්තේ ආහාර ආධාරය (රුපියල් කෝටි 4·65) සහ අධ්‍යාපනය (රුපියල් කෝටි 4·0) පිළිබඳවය. පෙර වර්ෂයන්හි මෙන් ම විශාලතම වැඩිවීමක් දක්වූ තනි වියදම් ශීර්ෂය ආහාර ආධාර මුදල විය. 1958/59 රුපියල් කෝටි 14·65 ක් වූ ආහාර ආධාරය 1959/60 දී රුපියල් කෝටි 19·30 ක් දක්වා වැඩි විය. මෙසේ ආහාර ආධාරය වැඩිවීම 1960 අප්‍රේල් 11 වැනි ද සිට සලාක

සටහන II—42

# රජයේ ශුද්ධ අය වැය

| | 1951–52 | 1952–53 |
|---|---|---|
| 1. ශුද්ධ අය වැය අතිරික්තය හෝ හිඟය (—) .. .. | — 257·1 | — 231·9 |
| (අ) ආදායම .. .. .. .. .. .. | 954·0 | 952·5 |
| (ආ) (1) වියදම්, එනම් ණය ගැනීම් හෝ ණය දීම් ගනුදෙනු වල ශුද්ධ ලැබීම් හෝ ගෙවීම් (ශුද්ධ) .. .. | —1,211·1 | —1,184·4 |
| ආදායමට අය වෙන වියදම් (1) ඇතුළුව (හිඳන් අරමුදල් දායක දීමනා හා ආදායමෙන් ගෙවන අවශ්‍ය රාජ්‍ය ණය බේරීම් හැර ((2) ආ (1) බලන්න*) .. .. | —1,004·6 | — 893·5 |
| (ආහාර ආධාර) .. .. .. .. | **(247·8)** | **(127·0)** |
| (2) ණය හා ණය අරමුදල් වියදම් (ණය කාර්යයන් සඳහා අත්තිකාරම් ඇතුළුව)* .. .. .. | — 203·0 | — 220·6 |
| (3) ජාතික සංවර්ධන සංචිතයට අය වෙන වියදම .. | — 7·7 | — 6·4 |
| (4) ගබඩා තොග හා උපකරණ ගිණුමට අත්තිකාරම් .. | — 16·8 | — 2·4 |
| (5) අනිකුත් අත්තිකාරම්* .. .. .. .. | 19·0 | — 52·8 |
| (6) විවිධ .. .. .. .. .. .. | 2·0 | — 8·7 |
| **හිඟය පියවීම** | | |
| 2. රජයේ ණය ගැනීම් හා ණයදීම් ගනුදෙනුවලින් උද්ගත වන ලැබීම් හා ගෙවීම් (—) (ශුද්ධ) .. .. .. .. | 184·1 | 216·5 |
| (අ) පාලන ණය ගැනීම් හා ණය ගෙවීම් (විවිධ කටයුතු සඳහා ගත් ණය ඇතුළුව) .. .. .. | — 34·2 | 11·9 |
| (1) තැන්පතු (නඩුකියන්නන්ගෙන් හා කොන්ත්‍රාත්කරුවන් යනාදීන්ගෙන් හා වියදම් නො කොට ඉතිරි වී ඇති විදේශාධාර) .. .. .. .. | — 16·2 | 21·4 |
| (2) විවිධ අරමුදල් (වැන්දඹු හා අනාථදරු විශ්‍රාම වැටුප් අරමුදල, රජයේ සේවකයන්ගේ අර්ථ සාධක අරමුදල ආදිය.) .. .. .. .. | — 0·6 | — 0·2 |
| (3) විවිධ ණය (කෘෂිකාර්මික හා කාර්මික ණය දෙන ආයතනයට, ප්‍රාදේශීය ණය හා සංවර්ධන අරමුදලට, පළාත් පාලන මණ්ඩල ආදියට.) .. .. .. | 18·6 | — 9·3 |
| (ආ) දේශීය වෙළෙඳ ණය ගැණුම් හා ගත් ණය ආපසු ගෙවීම් .. .. .. .. .. .. | — 218·3 | 204·6 |
| (1) රුපියල් ණයකර .. .. .. .. | 102·4 | 80·0 |
| —හිඳන් අරමුදල් දායක දීමනා හා ආදායමෙන් ගෙවන අවශ්‍ය රාජ්‍ය ණය බේරීම් .. .. .. | **18·4** | **28·1** |
| | 84·0 | 56·9 |
| (2) භාණ්ඩාගාර බිල්පත් .. .. .. .. | 62·3 | 90·6 |
| (3) මහ බැංකු අත්තිකාරම් .. .. .. .. | 72·0 | — 1·5 |
| (4) බදු සංචිත සහතික .. .. .. .. | — | — |
| (5) අනෙකුත්† .. .. .. .. .. | — | 58·6 |
| (ඇ) විදේශීය ණය ගැනීම් .. .. .. | — | — |
| 3. මුදල් ශෙෂයන්ගේ වෙනස්වීම් (පහසුවෙන් මුදල් කළ හැකි වත්කම් ඇතුළුව) .. .. .. .. .. | — 73·0 | — 15·4 |

*ගත වූ වර්ෂවල දී වැය වූ ණය කාර්යයන් සඳහා අත්තිකාරම් ගිණුම්හි පාඩු, "ආදායමට අය වෙන වියදම්" සහ "ණය අරමුදලට අය වෙන වියදම්" යන ගිණුම්වලට මාරු කිරීමෙන් උද්ගත වන පොත් ගැලපිලි (හර සහ බැර) අත්හැර ඇත. එබැවින් ලංකාණ්ඩුවේ ගිණුම්වල සංඛ්‍යාවන් හා මෙහි සංඛ්‍යාවන් නොසැසඳේ. මීට ඉහත වාර්ෂික වාර්තාවේ අත හරින ලද්දේ ණය කාර්යයන් සඳහා දෙන ලද අත්තිකාරම් සම්බන්ධයෙන් වූ පොත් ගැලපිලි පමණෙකි. ඊට අමතර වශයෙන් මෙම වාර්තාවෙහි අත්හැර ඇති අත්තිකාරම් ගිණුම්හි පාඩු සම්බන්ධයෙන් වූ පොත් ගැලපිලි නිසා කලින් වාර්ෂික වාර්තාවෙහි පළ වූ ශුද්ධ අය වැය අතිරික්තයන්හි/හිඟයන්හි වටිනාකම්හි වෙනසක් නොවේ. 1 ආ (1) හා 1 (ආ) (5) ශීර්ෂයන්හි එයට සරිලන වෙනස්වීම් සිදු කොට ඇති බැවිනි.

## අතිරික්තය හෝ හිඟය (—)

රුපියල් දශ ලක්ෂ

| 1953–54 | 1954–55 | 1955–56 | 1956–57 | 1957–58 | 1958–59 | 1959–60(ඇ) |
|---|---|---|---|---|---|---|
| 33·7 | 127·6 | — 1·2 | — 196·4 | — 222·3 | — 413·4 | — 417·5 |
| 1,026·2 | 1,158·6 | 1,257·2 | 1,260·5 | 1,280·0 | 1,330·4 | 1,403·8 |
| — 992·5 | —1,031·0 | —1,258·4 | —1,456·9 | —1,502·3 | —1,743·8 | —1,821·3 |
| — 772·0 | — 864·9(අ) | —1,014·4 | —1,105·2 | —1,280·1 | —1,432·2 | —1,511·9(ආ) |
| **(12·0)** | **(36·0)**(අ) | **(79·5)** | **(105·5)** | **(112·0)** | **(146·5)** | **(193·0)** |
| — 162·3 | — 215·5 | — 211·0 | — 213·3 | — 282·6 | — 303·4 | — 306·6 |
| — 3·2 | — 2·1 | — 4·0 | — 5·1 | — 3·0 | — 2·4 | — 1·5 |
| 4·6 | 9·9 | 1·2 | — 14·5 | ... | 10·5 | — 7·1 |
| — 61·1 | 34·0(අ) | — 30·3 | — 115·8 | 54·5 | — 17·1 | 5·8 |
| 1·5 | 7·6 | 0·1 | — 3·0 | 8·9 | 0·8 | ... |
| — 35·3 | — 39·0 | 12·2 | 175·4 | 174·7 | 351·8 | 411·6 |
| — 4·6 | 29·1 | — 36·5 | — 9·4 | 72·5 | 27·6 | 57·4 |
| — 2·1 | 34·5 | — 10·8 | 9·0 | 73·9 | 27·3 | 62·3 |
| 0·3 | — 0·9 | — 4·8 | — 2·3 | 20·1 | 4·2 | 2·7 |
| — 2·8 | — 4·5 | — 20·9 | — 16·1 | — 21·5 | — 3·9 | — 7·6 |
| — 94·0 | — 80·2 | 43·5 | 166·2 | 78·5 | 288·7 | 324·9 |
| 70·0 | 75·0 | 74·5 | 94·9 | 45·0 | 95·0 | 134·8 |
| **22·6** | **44·5** | **39·0** | **31·1** | **26·5** | **32·2** | **33·3** |
| 47·4 | 30·5 | 35·5 | 63·8 | 18·5 | 62·8 | 101·5 |
| — 78·1 | — 44·9 | 8·0 | — 3·0 | 74·6 | 179·0 | 228·2 |
| — 4·7 | — 65·8 | — | 96·3 | — 13·8 | 41·1 | 3·1(ආ) |
| — | — | — | 9·1 | — 0·8 | 5·8 | — 7·9 |
| — 53·6 | — | — | — | — | — | — |
| 63·3 | 12·1 | 5·2 | 18·6 | 23·7 | 35·5 | 29·3 |
| — 1·6 | 88·6 | 11·0 | — 21·0 | — 47·5 | — 61·7 | — 6·0 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

†ඇරැබි රාජ්‍ය නියෝජ්‍යතාවයන්ගෙන් ගත් ණය.

(අ) 1954–55 හේ ආහාර ආධාර සඳහා වූ රුපියල් කෝටි 3·6 මුදලක් අත්තිකාරම් ගිණුමේ සිට ආදායමට අය වෙන වියදමට මාරු කරන ලදී. මේ පොත් ගැලපිල්ල 1958–59 සංඛ්‍යාවන්ගෙන් ඉවත් කර තිබුන ද, (*සංක්ෂේපය බලන්න) 1954–55 සංඛ්‍යාවන් එය ඇතුලත් කිරීමෙන් සංශෝධනය කර ඇත.

(ආ) බ්‍රෙටන්වුඩ් ගිවිසුම් පනත යටතේ මහ බැංකුවෙන් ලබා ගත් විශේෂ ණය මුදලකින් නොවන ලද රුපියල් කෝටි 3·70 ක ජාත්‍යන්තර මුදල් අරමුදලට වැඩිකල දායක දීමනාව අත් හැර ඇත.

(ඇ) තාවකාලිකයි

හාල් සිල්ලර මිල සාමාන්‍යය සේරුවක් ශත 5 කින්* අඩු කිරීම ද සහතික මිල ක්‍රමය යටතේ, ගන්නා ලද වී ප්‍රමාණය වැඩිවීම හේතු කොටගෙනද උද්ගත වූවෙකි.

බුරුමයෙන් ගිවිසුම් යටතේ ගෙන්වූ හාල් ටොන් එකක ගොඩබෑම් මිල පසුගිය වර්ෂයේ දී මෙන් ම රුපියල් 530 ක් විය. ඇමෙරිකා එක්සත් ජනපද රාජ්‍ය නීති 480* යටතේ ලබා ගත්, හාල් ටොන් එකක මිල සාමාන්‍යය රුපියල් 800 සිට, රුපියල් 750 දක්වා අඩු විය. සීනි ටොන් එකක ගොඩබෑම් මිල සාමාන්‍යය රුපියල් 384 සිට රුපියල් 550 දක්වා වැඩි විය. හැම රටකින් ම ලබා ගත්, පිටි (රාජ්‍ය නීති 480 යටතේ ද)† ටොන් එකක මිල සාමාන්‍යය රුපියල් 406 සිට රුපියල් 448 දක්වා වැඩි විය.

සහතික කළ මිල ක්‍රමය යටතේ රජය විසින් මිල දී ගන්නා ලද වී සහල් ප්‍රමාණයෙන් බලන කල 1958/59 දී ටොන් 2,27,000 සිට ටොන් 2,70,000 දක්වා වැඩි විය. මුළු ආහාර ආධාරයෙන් සැලකිය යුතු කොටසක් නිෂ්පාදක ආධාරයක් වශයෙන් සහතික කළ මිල ක්‍රමය යටතේ මෙරට වී නිෂ්පාදකයාට දෙනු ලැබේ. වී බුසලකට රු. 12 ක් වන සහතික මිල හා ඊට බෙහෙවින් අඩු වන ආයාත සහල් බුසලක මිල සාමාන්‍යයත් අතර වෙනසෙන් මේ නිෂ්පාදක ආධාරය මැණේ.

**ප්‍රාග් ධන වියදම**

1959/60 මුළු ප්‍රාග් ධන වියදම (අය වැය ලේඛනයට බාහිරව කැරුනු වියදම් ද ඇතුළු ව) රුපියල් කෝටි 52·58 ක් විය. මෙය 1958/59 කැරුණු ප්‍රාග් ධන වියදමට රුපියල් කෝටි 3·3 කින් පමණ අධිකය. 1958/59 රුපියල් කෝටි 44·32 ක් වූ මූර්ත වත්කම් අත්කර ගැනීම නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යෑම පිළිබඳව වූ රජයේ අවක්‍ර ප්‍රාග් ධන වියදම 1959/60 දී රුපියල් කෝටි 46·97 ක් විය. දැනට ලබා ගත හැකි සංඛ්‍යා අනුව මේ වැඩිවීම මුළුමනින් ම වාගේ සිදු වී ඇත්තේ රජයේ ආර්ථික සේවාවන් පිළිබඳ වය. එනම්, කර්මාන්ත, කෘෂිකර්මය සහ පොදු ප්‍රයෝජ්‍ය සේවා රාජ්‍ය ආරක්ෂාව පිළිබඳ කැරුනු ප්‍රාග් ධන වියදම්හි සැලකිය යුතු අඩුවීමක් දක්වෙයි. රාජ්‍ය නියෝජ්‍යත්ව යන්ට ප්‍රාග් ධන කාර්යයන් සඳහා කැරුනු ණය දීම් 1958/59 රුපියල් කෝටි 4·98 ක් වූ අතර, 1959/60 කෝටි 5·61 විය.

**අය වැය ලේඛන හිඟය පියවීම**

1959/60 අය වැය ලේඛන හිඟය පියවා ගැනීමට මුදල් ලබා ගත් මාර්ගයන් ද, එම අය වැය ලේඛනයෙහි ශුද්ධ අවක්‍ර උද්ධමන බලපෑම ද පහත සංඛ්‍යා සටහනෙන් දක්වේ. 1958/59 පිළිබඳ සංසන්දිත සංඛ්‍යා ද මෙහි ඇතුලත් වේ.

සටහන II—43

**හිඟය පියවූ ආකාරය**

රුපියල් දශ ලක්ෂ

| | 1958–59 | 1959–60 (තාවකාලික සංඛ්‍යා) |
|---|---|---|
| 1. පරිපාලන ණය ගැනුම් .. .. .. .. .. .. | 27·6 | 57·4 |
| 2. විදේශීය ණය ගැනුම් .. .. .. .. .. .. | 35·5 | 29·3 |
| 3. දේශීය වෙළෙඳ පොළෙන් ණය ගැනුම්—බැංකු නොවන ආයෝජකයන්ගෙන් (නිදන් අරමුදල් දායක දීම්නා අත්හැර) | 109·4 | 83·8 |
| 4. දේශීය වෙළෙඳ පොළෙන් ණය ගැනුම්—බැංකු ක්‍රමයෙන් .. | 179·3 | 241·1 |
| 5. රජයේ මුදල් ශේෂයන්හි අඩුවීම .. .. .. .. | 61·7 | 6·0 |
| 6. ශුද්ධ අය වැය ලේඛන හිඟය .. .. .. .. .. | 413·4 | 417·5 |
| 7. එක්සත් ජනපදයේ ප්‍රතිපාර්ශ්වික අරමුදලේ හිඟුමේ අඩුවීම (—ලකුණෙන් වැඩිවීමක් දක්වෙයි.) .. .. | — 52·5 | 4·0 |
| 8. අය වැය ලේඛනයේ ශුද්ධ උද්ධමන බලපෑම (4+5+7) .. | 188·5 | 251·1 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

*1960 අප්‍රේල් 11 වැනිදට පළමුව, එක් අයෙකුගේ සලාකය වූ හාල් සේරු දෙකෙන් පළමු වැනි හාල් සේරුව සත 25 ට ද දෙ වැනි සේරුව සත 35 ට දෙන ලදී.

1960 අප්‍රේල් 11 වැනිද සිට දෙ වැනි සේරුවේ මිල ද සත 25 ට අඩු කරන ලදී. එම නිසා සලාක හාල් සේරුවක මිල සාමාන්‍යය සත 30 සිට 25 දක්වා අඩු විය.

†ඇමෙරිකා එක්සත් ජනපද රාජ්‍ය නීති 480 යටතේ ලබා ගන්නා සහල් සහ පිටි සඳහා ගෙවිය යුත්තේ රුපියල් මුදලින් පමණක් බව සැලකිය යුතුය. තව ද, මේ රුපියල් ගෙවීමෙන් කොටසක් පරිත්‍යාග සහ දීර්ඝ කාලීන් ණය මුදල් වශයෙන් ලංකාණ්ඩුවට ආපසු දෙනු ලැබේ.

1959/60 මුදල් වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද මුල් (ශුද්ධ) අය වැය ලේඛන හිඟය රුපියල් කෝටි 36·79 ක් විය. මේ හිඟය පියවීම් වස් මුදල් අමාත්‍ය වරයා විසින් තම අය වැය කථාවේ දී ප්‍රකාශ කරන ලද නිශ්චිත මුදල් මාර්ගයන් දේශීය වෙළෙඳ පොළෙන් ලබා ගැනීමට බලාපොරොත්තු වූ රුපියල් කෝටි 11·67 ක* ශුද්ධ ණය ගැනීමක් ද රුපියල් කෝටි 12·50 ක අපේක්ෂිත විදේශාධාර ලැබීමකින් ද සමන්විත විය. "පුරුදු මුදල් මාර්ගයන්ගෙන්" ලබා ගැනීමට බලාපොරොත්තු වූ රුපියල් කෝටි 5·0 ක් ද මීට අමතරව සඳහන් විය. අය වැය ලේඛනයට අනතුරුව සිදු වූ වර්තන වියදම් ප්‍රසාරණය ද විදේශාධාර පිළිබඳ අය වැය ලේඛනයෙන් කළ අපේක්ෂාවන් නිෂ්ඵල වීම ද, රජයේ මුදල් ශෙෂ ඉතා අඩු මට්ටමක පැවැත්ම ද හේතු කොට රජයට බැංකු ක්‍රමයෙන් ලබා ගැනීමට අවශ්‍ය වූ මුදල් ප්‍රමාණය පෙර මුදල් වර්ෂයේ එසේ ලබා ගත් ප්‍රමාණයට වඩා අධික විය.

බැංකු ණය මුළුමණින් ම වාගේ ලබා ගන්නා ලද්දේ මහ බැංකුවට භාණ්ඩාගාර බිල්පත් විකිණීමෙනි. වෙළෙඳ බැංකු වෙත වූ රජයේ ණයපත් (භාණ්ඩාගාර බිල්පත් ඇතුළුව) වර්ෂය තුළ රුපියල් කෝටි 0·26 ක සුළු වැඩිවීමෙක් දක්විය. මෙය වෙළෙඳ බැංකු සතු රුපියල් ණයපත් රුපියල් කෝටි ·21 ක පහළ වැටීමෙකින් හා භාණ්ඩාගාර බිල්පත් අයිතියෙහි රුපියල් කෝටි 0·47 ක වැඩිවීමෙකින් ද සමන්විත විය.

මුදල් සැපයුම කෙරෙහි රජයේ ගනුදෙනු දරන බලපෑම අය වැය ලේඛනයේ අවක්‍ර උද්ධමන බලපෑම ලෙස මූල්‍ය විග්‍රහයේ දී දළ වශයෙන් සලකනු ලැබේ. පෙර වාර්ෂික වාර්තාවන්හි මෙය මණින ලද්දේ රජය බැංකුවලින් ලබා ගත් ණය ප්‍රමාණය සහ රජයේ මුදල් ශේෂයන්හි අඩුවීම යන දෙකෙහි එකතුවෙනි. ඇමෙරිකා එක්සත් ජනපදයේ රාජ්‍ය නීති 480 යටතේ සිදු කෙරෙන ගනුදෙනුවලින් උද්ගත වන ප්‍රතිපාර්ශ්වීය අරමුදල් ක්‍රමය කරණකොට මේ මිණුම් ක්‍රමය ප්‍රතිශෝධනය කළ යුතු ව තිබේ. ඇමෙරිකා එක්සත් ජනපදයේ රාජ්‍ය නීති 480 යටතේ ඇති ගිවිසුම් අනුව රජය එක්සත් ජනපදයෙන් සහල් සහ පිටි මිලට ගත් විට, ඒ සඳහා ගෙවනු ලබන රුපියල් මුදල් මහ බැංකුව වෙතැති එක්සත් ජනපද ආධාර ප්‍රතිපාර්ශ්වීය අරමුදල් ගිණුමට බැර කරනු ලැබේ. මෙසේ කරන ලද ගෙවීම්වලට අනුරූප ප්‍රමාණයකින් රජයේ මුදල් ශේෂ අඩු වුව ද, ඒ ගෙවීම් කෙළින් ම පුද්ගලික අංශයට කරන ගෙවීම් නොවන හෙයින්; ඒ කරණකොට මුදල් සැපයුමෙහි වැඩිවීමක් සිදු නොවේ. ඇත්ත වශයෙන් මෙ වැනි මුදල් සැපයුම් ගෙවීම අවධමන බලපෑමක් ඇති කරයි. රජයට දෙන ලද ණය සහ පරිත්‍යාග වැඩි කිරීමෙන් හෝ එක්සත් ජනපද තානාපති කාර්යාලයීය වියදම් සඳහා හෝ පෞද්ගලික අංශයේ ආයෝජනය සඳහා හෝ මේ ගිණුමෙන් මුදල් වැය කළ විට මුදල් කෙරෙහි ඇති වනුයේ උද්ධමන බලපෑමෙකි.

1958/59 අය වැය ලේඛනයේ අවක්‍ර උද්ධමන බලපෑම රුපියල් කෝටි 24·1 ක් වූ බව 1959 යේ වාර්ෂික වාර්තාවේ සඳහන් කරන ලදී. එක්සත් ජනපද ප්‍රතිපාර්ශ්වීය අරමුදල් ගිණුම් ශෙෂයෙහි වෙනස්වීම් සඳහා මෙය ගැලපූ විට 1958/59 අය වැය ලේඛනයේ උද්ධමන බලපෑම රුපියල් කෝටි 18·85 ක් වූ බව පෙනේ. 1959/60 සඳහා මීට අනුරූප සංඛ්‍යාව රුපියල් කෝටි 25·11 කි. එක්සත් ජනපද රාජ්‍ය නීති 480 ට අදාළ ප්‍රතිපාර්ශ්වීය අරමුදල් සම්බන්ධයෙන් කෙරෙන ගනුදෙනු 1958/59 යේ රු. කෝටි 5·25 ක අවධමන බලපෑමක් ඇති කළ ද 1959/60 රුපියල් කෝටි 0·4 ක උද්ධමන බලපෑමක් ඇති කැරිණි.

දේශීය වෙළෙඳ පොළ මගින් බැංකු නොවන ආයෝජනයන් වෙතින් ලබා ගත් ණය මුදල් ප්‍රමාණය 1958/59 රුපියල් කෝටි 10·94 සිට 1959/60 රුපියල් කෝටි 8·38 දක්වා අඩු විය. මෙයට හේතුව වූයේ සාමාන්‍යයෙන් වෙළෙඳ පොළ මගින් ආයෝජනය කෙරෙන දෙපාර්තමේන්තු සහ අනෙකුත් කාර්යාලීය අරමුදල් සතු අතිරික්ත මුදල් ශේෂ භාණ්ඩාගාරය විසින් කෙළින් ම ලබා ගැනීමය. රුපියල් ණය පත් සහ භාණ්ඩාගාර බිල්පත් මිල දී ගැනීමෙන් සේවා අර්ථ සාධක අරමුදලෙන් රජයට දෙන ලද ණය මුදල් ප්‍රමාණය 1958/59 රුපියල් කෝටි 0·55 සිට 1959/60 රුපියල් කෝටි 4·90 දක්වා වැඩි විය. එහෙත් ඉතිරිකිරීමේ ආයතන සහ රක්ෂණ සමාගම් විසින් රජයට මෙසේ දෙන ලද ණය මුදල් ප්‍රමාණය 1958/59 පිළිවෙළින් රුපියල් කෝටි 3·04 රේ සහ රුපියල් කෝටි 1·54 රේ සිට 1959/60 පිළිවෙළින් රුපියල් කෝටි 1·71 සහ රුපියල් කෝටි 1·17

*අයවැය කථාවේ මේ පිළිබඳ සඳහන් කරන ලද සංඛ්‍යාව රුපියල් කෝටි 15·0 කි. රුපියල් කෝටි 11·67 ලැබෙන්නේ රාජ්‍ය ණය නිදන් අරමුදල් දායක දීමනා වන රුපියල් කෝටි 3·33 රුපියල් කෝටි 15·0 වෙන් වෙන් කර ගැනීමෙනි. ශුද්ධ අය වැය ලේඛන හිඟයේදී නිදන් අරමුදල් දායක දීමනා රජයේ වියදමක් ලෙස නො සැලකේ.

දක්වා අඩු විය. ඉහත සංඛ්‍යා සටහනෙහි පරිපාලනමය ණය ගැනුම්වලට ඇතුලත් කර ඇති රුපියල් කෝටි 4·60 වන මේ ප්‍රමාණය දේශීය වෙළෙඳ පොළ මගින් බැංකු නොවන ආයෝජනයන්ගෙන් ලබාගත් ණය මුදලට එකතු කළ විට එහි රුපියල් කෝටි 2·04 වැඩිවීමෙක් දැක්වේ.

1959/60 ප්‍රාග් ධන කාර්යයන් සඳහා ලැබුණු දළ විදේශාධාර ප්‍රමාණය රුපියල් කෝටි 3·86 ක් විය. මෙය රුපියල් කෝටි 2·93 ක ණය දීම්වලින් ද රුපියල් කෝටි 0·93 ක පරිත්‍යාගයන්ගෙන් ද සමන්විත විය. එහෙත් රන් පවුම් ණය පිළිබඳ රුපියල් කෝටි 1·07 ක ද, අනෙකුත් විදේශීය ණය පිළිබඳ රුපියල් කෝටි 0·27 ක ද ණය බේරීම් කරන ලදී.

**රාජ්‍ය ණය**

දේශීය සහ විදේශීය, මුළු රාජ්‍ය ණය පිළිබඳ විස්තර පරිශිෂ්ටයෙහි එන 23 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. පසුගිය මුදල් වර්ෂ සතර අවසානයේ වූ මුළු රාජ්‍ය ණය පිළිබඳ සංඛ්‍යා පහත සංඛ්‍යා සටහනින් දැක්වේ.

සටහන II—44

**මුළු රාජ්‍ය ණය**

රුපියල් දශ ලක්ෂ

| සැප්තැම්බර් අවසානයේ දී | දළ | (ශුද්ධ) සිඳුන් අරමුදල් හැර |
|---|---|---|
| 1957 .. .. .. .. .. .. .. .. .. | 1,363·9 | 1,123·3 |
| 1958 .. .. .. .. .. .. .. .. .. | 1,495·4 | 1,212·1 |
| 1959 .. .. .. .. .. .. .. .. .. | 1,837·0 | 1,524·7 |
| 1960 .. .. .. .. .. .. .. .. .. | 2,230·5 | 1,913·5 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

1959/60 මුදල් වර්ෂයේ දී මුළු දළ රාජ්‍ය ණය රුපියල් කෝටි 39·35 කින් ද, මුළු ශුද්ධ රාජ්‍ය ණය රුපියල් කෝටි 38·88 කින් ද වැඩි විය. 1958/59 සඳහා මේ පිළිබඳ අනුරූප සංඛ්‍යා රුපියල් කෝටි 34·16 ක් සහ රුපියල් කෝටි 31·26 ක් විය. 1959/60 වූ රුපියල් කෝටි 39·35 දළ රාජ්‍ය ණය වැඩිවීම රුපියල් ණයපත්හි කෝටි 11·50 ක ද, භාණ්ඩාගාර බිල්පත්හි රුපියල් කෝටි 13·0 ක ද මහ බැංකු අත්තිකාරම්හි රුපියල් කෝටි 4·01 ද, විදේශීය ණයෙහි රුපියල් කෝටි 1·63 ක ද වැඩිවීම් වලින් සහ බදු සංචිත සහතිකවල රුපියල් කෝටි 0·79 ක අඩුවීමකින් ද සමන්විත විය.

**රුපියල් ණය පත්**

1959/60 මුදල් වර්ෂය තුල රුපියල් ණයපත් නිකුතු සයක් කැරිණි. ඉන් එකක්, 1965/67 සියයට 2 3/4 ක ලෝනය අර්ධ වශයෙන් 1960 ජූලි මස 15 වැනි දට බේරීමට නියමව තුබූ 1959/60 සියයට 2 1/2 වික්ටරි ලෝනය පරිවර්තනය කිරීම සඳහා විය. මුළුමනින් ම අළුත් මුදල් සඳහා වූ අනිකුත් ලෝන පහ මෙසේ විය. 1959 ඔක්තෝබර්හි නිකුත් කරන ලද 1975/79 සියයට 3 1/2 ලෝනය, 1960 අප්‍රේල්හි නිකුත් කළ 1976/80 සියයට 3 1/2 ලෝනය 1960 මැයිහි නිකුත් කළ 1976/80 වේ ''බී'' කාණ්ඩයේ සියයට 3 1/2 ලෝනය, 1960 ජූනියෙහි නිකුත් කළ 1976/80 වේ ''සී'' කාණ්ඩයේ සියයට 3 1/2 රේ ලෝනය, සහ 1960 අගෝස්තුහි නිකුත් කළ 1976/80 ''ඩී'' කාණ්ඩයේ සියයට 3 1/2 රේ ලෝනය. රුපියල් කෝටි 13·50 ක් සඳහා වූ නිකුතු සය සම්පූර්ණයෙන්ම ලැබිණ. ණය පත් බෙදී ගිය අයුරු මීලඟ සංඛ්‍යා සටහනින් දැක්වේ.

සටහන II—45

රුපියල් දශ ලක්ෂ

| දායකයෝ | 3½% 1975–79 ණය | 3½% 1976–80 ණය | 3½% 1976–80 ණය බී කාණ්ඩය | 3½% 1976–80 ණය සී කාණ්ඩය | 2¾% 1965–67 ණය | | 3½% 1976–80 ණය ඩී කාණ්ඩය | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | සමුච්චිත | මුදල් | | මුළු | % |
| වෙළෙඳ බැංකු .. | — | — | — | — | 11·1 | — | — | 11·1 | 8·2 |
| සමූපකාර ප්‍රදේශීය බැංකු .. .. | 0·2 | 0·4 | 0·4 | 0·6 | — | 0·2 | 0·6 | 2·4 | 1·8 |
| ඉතිරි කිරීමේ ආයතන .. | 5·8 | 6·9 | 4·0 | 2·8 | 0·2 | 0·2 | — | 19·9 | 14·7 |
| පිඳන් අරමුදල් .. | 12·2 | 1·2 | 10·5 | 3·5 | — | — | 1·6 | 29·0 | 21·5 |
| දෙපාර්තමේන්තු සහ රජයේ අනිකුත් ණය .. | 1·4 | 2·0 | 0·4 | 0·3 | 0·5 | 0·5 | 0·2 | 5·3 | 3·5 |
| භාරකාර, අර්ථ සාධක සහ විශ්‍රාම අරමුදල් | 4·8 | 23·2 | 7·8 | 10·3 | 0·1 | 0·3 | 10·7 | 57·2 | 42·4 |
| රක්ෂණ සමාගම් .. | 0·2 | 1·2 | 1·8 | 2·3 | — | 1·8 | 1·6 | 8·9 | 6·6 |
| අනෙකුත් සමාගම් | — | — | — | 0·1 | — | — | 0·3 | 0·4 | 0·3 |
| පුද්ගලයන්, සමාජ සහ ආයතන .. | 0·4 | 0·1 | 0·1 | 0·1 | — | 0·1 | — | 0·8 | 0·6 |
| එකතුව.. .. | 25·0 | 35·0 | 25·0 | 20·0 | 11·9 | 3·1 | 15·0 | 135·0 | 100·0 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

**භාණ්ඩාගාර බිල්පත්**

1958/59 දී මෙන්ම 1959/60 දළ රාජ්‍ය ණය ඉහළ යෑම වැඩි වශයෙන්ම සිදු වූයේ භාණ්ඩාගාර බිල්පත් සම්බන්ධයෙනි. 1959 සැප්තැම්බර් අවසානයේ දී රුපියල් කෝටි 32·0 ක් වූ භාණ්ඩාගාර බිල්පත් සංඛ්‍යාව 1960 සැප්තැම්බර් අවසානය වන විට රුපියල් කෝටි 55·0 දක්වා වැඩි විය. මෙසේ වැඩි වූ බිල්පත් වැඩි වශයෙන් මිලට ගන්නා ලද්දේ මහ බැංකුව විසිනි.

මුදල් වර්ෂය තුල දී භාණ්ඩාගාර බිල්පත් පිළිබඳ බලය ලත් සීමාව 1959 යේ ඔක්තෝබර් 29 වැනිද රුපියල් කෝටි 35·0 සිට රුපියල් කෝටි 45·0 දක්වා ද, 1960 අගෝස්තු 23 වැනිද රුපියල් කෝටි 65·0 දක්වා ද, පාර්ලිමේන්තු යෝජනා සම්මුතියකින් දෙවරක් වැඩි කරන ලදී.

**විදේශීය ණය ගැනීම්**

1959/60 විදේශීය ණය ගිවිසුම් යටතේ රුපියල් කෝටි 2·66 ලැබුණු අතර, රුපියල් කෝටි 1·07 ක කල්පිරුණු රන් පවුම් ලෝනයක් බේරන ලදී. මේ අනුව දළ විදේශීය ණය ප්‍රමාණය රුපියල් කෝටි 1·62 කින් වැඩි විය. විදේශීය ණය ගිවිසුම් යටතේ ලැබුණු රුපියල් කෝටි 2·66 සමන්විත වූ අන්දම පහත සංඛ්‍යා සටහනින් දැක්වේ.

සටහන II—46

රුපියල් දශ ලක්ෂ

| | |
|---|---|
| ජාත්‍යන්තර ප්‍රතිසංස්කරණ හා සංවර්ධන බැංකුව .. .. .. | 8·3 |
| ජාත්‍යන්තර ණය දෙන ආයතනය .. .. .. .. .. | 11·4 |
| සංවර්ධන ණය අරමුදල .. .. .. .. .. .. .. | 4·7 |
| එක්සත් සමාජවාදී සෝවියට් රුසියාව .. .. .. .. .. | 1·1 |
| මහජන චීනය .. .. .. .. .. .. .. .. | 3·7 |
| ආපසු ගෙවීම් හැර .. .. .. .. .. .. .. | — 2·7 |
| | 26·6 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

**නිදන් අරමුදල්**

1959/60 මුදල් වර්ෂය අවසානය වන විට, රාජ්‍ය ණය බේරීම් සඳහා පිහිටුවා ඇති නිදන් අරමුදල්හි වටිනාකම රුපියල් කෝටි 31·75 ක් විය. 1958/59 සංඛ්‍යා හා සැසඳූ විට මින් රුපියල් කෝටි 0·51 වැඩිවීමක් දක්වෙයි. රුපියල් කෝටි 1·07 ක කල්පිරුණු රන් පවුම් ලෝනයක් බේරීම සඳහා රුපියල් කෝටි 3·08 ක් ද 1955/60 සියයට 2 1/2 වික්ටරි ලෝනය බේරීම සඳහා රු. කෝටි 2·01 ක් ද නිදන් අරමුදල්වලින් ඉවත් කරන ලදී. එසේ වුව ද, වර්ෂය තුළදී අර්ධ වාර්ෂික දයක දීමනා ද ආයෝජනවලින් පොළී ද ලැබීමත් නිසා නිදන් අරමුදල්හි වැඩිවීමක් සිදු විය.

**රාජ්‍ය ණය පිළිබඳ වෙළෙඳ ගනුදෙනු**

පසුගිය මුදල් වර්ෂ පහ තුල දී මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව මගින් කැරුණු රාජ්‍ය ණය ගනුදෙනු සම්බන්ධව තොරතුරු පහත සංඛ්‍යා සටහනේ දක්වේ.

සංඛ්‍යා සටහන II—47

| රජයේ මුදල් වර්ෂය | මෙරටින් ගන්නා ලද ණය | බේරන ලද ණය | නිකුත් කළ පොළී බලපත්‍ර | | පැවරුම් ආදියෙන් කැරුණු මුළු ගනුදෙනු ප්‍රමාණය | නිදන් අරමුදලින් කළ ආයෝජන |
|---|---|---|---|---|---|---|
| | | | වටිනාකම | ගණන | | |
| | රු. ශත | රු. ශත | | රු. ශත | | රු. ශත |
| 1955–56 .. | 10,00,00,000 | 4,73,63,400 | 6,902 | 2,64,08,664 | 17,93,97,000 | 2,13,30,022 |
| 1956–57 .. | 9,50,00,000 | 1,50,93,200 | 7,108 | 3,01,78,417 | 17,38,44,200 | 2,40,84,362 |
| 1957–58 .. | 7,94,74,400 | 5,61,43,700 | 6,639 | 2,95,85,738 | 26,00,69,800 | 2,69,77,182 |
| 1958–59 .. | 12,04,16,800 | 3,50,25,200 | 6,452 | 3,10,23,531 | 19,43,74,800 | 3,43,30,831 |
| 1959–60 .. | 19,50,00,000 | 5,52,39,200 | 6,448 | 3,39,14,621 | 31,81,09,900 | 2,15,30,408 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

**අන්‍ය රාජ්‍ය ආයතනයන් විසින් ණය ගැනීම්**

මුදල් වර්ෂය තුල දී නිවාස අරමුදල් ණයපත් නිකුතුවක් කරන ලදී. මෙය රුපියල් කෝටි 0·50 ක් සඳහා කැරුනු 1976/80 වේ සියයට 3 1/2 නිකුතුව විය. මේ ණය පත් බෙදී ගිය අයුරු පහත සටහනින් දක්වේ.

සංඛ්‍යා සටහන II—48

| | ප්‍රමාණය රුපියල් අශ ලක්ෂ | සියයට ගණන |
|---|---|---|
| සමූපකාර බැංකු .. .. .. .. .. | 0·1 | 2·0 |
| නිදන් අරමුදල් .. .. .. .. .. | 3·1 | 62·0 |
| ඉතිරිකිරීමේ ආයතන .. .. .. .. | 1·7 | 34·0 |
| භාරකාර, අර්ථ සාධක සහ විශ්‍රාම අරමුදල් .. .. | 0·1 | 2·0 |
| පෞද්ගලික .. .. .. .. .. .. | ... | ... |
| | 5·0 | 100·0 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

වර්ෂය තුල දී රජයේ උකස් බැංකුව විසින් ණයපත් නිකුතු කිසිත් නො කැරිණි. උකස් බැංකුවට අවශ්‍ය කළ මුදල් වෙළෙඳ බැංකුවලින් ණයට ලබා ගන්නා ලදී. මෙසේ ලබා ගත් ප්‍රමාණය රුපියල් කෝටි ·75 ක් විය.

**1960–61 අය වැය ලේඛනය**

1960–61 මුදල් වර්ෂය සඳහා පාර්ලිමේන්තුවෙන් සම්මත වූ මුල් ආදායම් සහ වියදම් ඇස්තමේන්තු මෙසේය:—

සංඛ්‍යා සටහන II—49

**1960–61 මුල් අයවැය ඇස්තමේන්තු**

රුපියල් දශ ලක්ෂ

| | |
|---|---|
| වර්තන වියදම් .. .. .. .. .. .. .. .. .. | 1,500·1 |
| ප්‍රාග්ධන වියදම් (අය වැය ලේඛනයට ඇතුලත් වා පමණක්).. .. .. | 496·1 |
| මුළු වියදම .. .. .. .. .. .. .. .. .. | 1,996·2 |
| මුළු ආදායම .. .. .. .. .. .. .. .. .. | 1,633·9 |
| දළ අයවැය ලේඛන හිඟය .. .. .. .. .. .. .. .. | 362·3 |
| ඇස්තමේන්තු කළ නිදන් අරමුදල් දයක දීමනා හැර .. .. .. | —36·1 |
| ඇස්තමේන්තුකළ ශුද්ධ අයවැය ලේඛන හිඟය.. .. .. .. .. | 326·2 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

රුපියල් කෝටි 24·0 ක දේශීය වෙළෙඳ පොළෙන් ණය ගැනුමකින්ද, රුපියල් කෝටි 10·0 ක විදේශාධාර වලින්ද දළ අය වැය ලේඛන හිඟය පියවීමට මුදල් අමාත්‍යවරයා බලාපොරොත්තු වෙයි.

**ආදායම**

ඇස්තමේන්තු කර ඇති රුපියල් කෝටි 163·39 ආදායමට අය වැය ලේඛනයෙන් යෝජිත නව බදුවලින් ලබා ගන්නට බලාපොරොත්තු වන රුපියල් කෝටි 13·0 ක් ද ඇතුලත්ය. රුපියල් කෝටි 1·50 ක් ලබා ගත හැකි ඉඩම් බද්දක් ද, රුපියල් කෝටි 5·0 ක ආදයමක් ලබා ගත හැකි වෙළෙඳ නාම ලියා පදිංචි කිරීමේ බද්දක් ද, රුපියල් කෝටි 1·0 ක ආදයමක් ලබා ගත හැකි සීමිත සමාගම් ප්‍රාග්ධන බද්දක් ද රුපියල් කෝටි 3·0 ක ආදයමක් ලබා දෙන ආදයම් බද්ද පිළිබඳ අමතර අය කිරීමක් ද රුපියල් කෝටි 1·50 ආදයමක් ලබා ගත හැකි වීසා බලපත්‍ර බද්දක් ද, අය වැය ලේඛනයෙන් යෝජිත නව බදු අතර වේ. දේශීය කාර්මික නිෂ්පාදනයට අඩංගු වන ආයාතයන් කීපයක් සම්බන්ධව ආයාත තීරු බදු අඩු කිරීමක් ද අය වැය ලේඛනයෙන් ප්‍රකාශයට පත් කැරිණි.

1959/60 නියම ආදයම හා සැසඳූ විට 1960/61 ආයාත බදු පිළිබඳ ඇස්තමේන්තුවේ රුපියල් කෝටි 2·66 ක වැඩිවීමෙක් ද, පෞද්ගලික වස්තු ත්‍යාග සහ වියදම් බදුවල රුපියල් කෝටි 1·78 ක වැඩිවීමෙක් ද ආදයම් බද්දෙහි රුපියල් කෝටි 4·55 ක වැඩිවීමෙක් ද නිර්යාත බදුවල (තේ වෙළෙඳ බද්ද ඇතුළු) රුපියල් කෝටි 1·18 ක අඩුවීමෙක් ද දක්වේ.

අය වැය ඇස්තමේන්තු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් පසු, රබර් නිර්යාත බද්ද දෙවරක් එනම් 1960 නොවැම්බර් 24 වැනිද රාත්තලකට ශත 38 සිට 28 දක්වා ද, 1961 පෙබරවාරි 16 වැනිද ශත 20 දක්වා ද අඩු කරන ලදී. මේ බදු අඩුකිරීම් කරණකොට නිර්යාත බදු පිළිබඳ මුල් ඇස්තමේන්තුවේ රුපියල් කෝටි 2·60 ක අඩුවීමක් බලාපොරොත්තු විය හැකිය. එනමුදු 1961 ජනවාරි මස පනවන ලද ආයාත තීරු බදු වැඩිකිරීම් හේතු කොට ආයාත බදු ආදයමෙහි වැඩිවීමෙක් බලාපොරොත්තු විය හැකිය.

එසේ වුව ද, 1960 දෙසැම්බර් අවසාන වන විට, තම බදු පිළිබඳ ව්‍යවස්ථා පනවා නොතිබූ හෙයින් ඇස්තමේන්තු කර ඇති ආදයම කොතෙක් දුරට සාර්ථක වේදැයි දැන්ම නිගමනය කළ නොහේ.

**වර්තන වියදම්**

රුපියල් කෝටි 146·40 ක් වූ ඇස්තමේන්තු කර ඇති 1960/61 සඳහා (නිදන් අර මුදල් දයක දීමනා හැර) වර්තන වියදම 1959/60 නියම වියදමට රුපියල් කෝටි 10·20 කින් ද, මුලින් ඇස්තමේන්තු කළ වියදමට රුපියල් කෝටි 19·30 න් ද වැඩි ය. 1959/60 නියම වර්තන වියදම පිළිබඳ සැහෙන ප්‍රමාණයක විස්තර නොමැති හෙයින්, 1959/60 නියම වියදමත්, 1960/61 සඳහා ඇස්තමේන්තු කර ඇති වියදමත් සංසන්දනය කළ නො හැකිය. එහෙත් 1959/60 මුල් ඇස්තමේන්තු හා සැසඳූ විට, 1960/61 වර්තන වියදම් ඇස්තමේන්තුවෙහි වැඩිවීම ප්‍රධාන වශයෙන් සිදු වී ඇත්තේ ආහාර ආධාරය (රුපියල් කෝටි 9·20) සමාජ සේවා (රුපියල් කෝටි 3·0) සහ ආර්ථික සේවා (රුපියල් කෝටි 1·1) සම්බන්ධයෙනි.

ඇතැම් ආවර්තන වියදම් ශීර්ෂ සඳහා 1960–61 අය වැය ලේඛනයෙන් මුලින් ඇස්තමේන්තු වී ඇති වියදම් ප්‍රමාණයන්හි සියයට 10 ක කැපීමක් 1961 ජනවාරි මාසයේ දී පනවන ලදී. මේ වියදම් කැපීම හේතු කොට ගෙන රුපියල් කෝටි 1·5–2·0 දක්වා අඩු වැයක් අපේක්ෂා කෙරේ.

**ප්‍රාග් ධන වියදම්**

1960–61 සඳහා ඇස්තමේන්තු කර ඇති (අය වැය ලේඛනයට බාහිර ප්‍රාග් ධන වියදම් ද ඇතුළුව) මුළු ප්‍රාග් ධන වියදම රුපියල් කෝටි 52·29 කි. මෙය 1959/60 වූ නියම ප්‍රාග් ධන වියදමට රුපියල් කෝටි 0·29 කින් අඩුය. මේ අඩුවීම මුළුමණින් ම සිදු වී ඇත්තේ රාජ්‍ය නියෝජ්‍යත්වයන්ට කැරෙන ණය දීම් සම්බන්ධයෙනි. 1959/60 රුපියල් කෝටි 5·61 ක් වූ මේ සඳහා 1960/61 ඇස්තමේන්තු කර ඇත්තේ රුපියල් කෝටි 1·94 කි. මූර්ත වත්කම් අත්කර ගැනීම, ගොඩනැංවීම සහ පවත්වාගෙන යෑම සඳහා කැරෙන අවක්‍ර ප්‍රාග් ධන වියදම් 1959/60 රුපියල් කෝටි 46·97 ක් විය. මේ සඳහා 1960/61 ඇස්තමේන්තු කර ඇති ප්‍රමාණය රුපියල් කෝටි 50·35 කි. මෙ වර ප්‍රාග් ධන වියදම් ඇස්තමේන්තු සියයට 25 ක අඩු වැයක් සඳහා සකස් කර ඇති හෙයින්, රුපියල් කෝටි 50·35 හේ මුළු ප්‍රමාණයම වියදම් වේ යැයි බලාපොරොත්තු විය හැකිය.

**හිඟය පියවීම සඳහා යෝජනා කර ඇති මුදල් මාර්ග:—**

දේශීය වෙළෙඳ පොළෙන් ලබා ගැනීමට අපේක්ෂා කරන රුපියල් කෝටි 24·0 මධ්‍ය සහ දීර්ඝ කාලීන ණය ගැනීම්වලින් විය හැකිය. මෙය මේ මාර්ගයෙන් 1959/60 ලබා ගන්නා ලද ප්‍රමාණයට රුපියල් කෝටි 1·05 කින් වැඩිය. මෙම මුදල් වර්ෂයේ මුල් මාස පහ තුල මධ්‍ය සහ දීර්ඝ කාලීන ණය ගැනීම්වලින් රුපියල් කෝටි 13·50 ලබා ගෙන ඇත.

විදේශාධාර ලෙස බලාපොරොත්තු වන රුපියල් කෝටි 10·0 අය වැය ලේඛන ඉදිරිපත් කරන විට තීරණය කර තිබූ හෝ සාකච්ඡා වෙමින් පැවැති ගිවිසුම්වලට අදාළය. ජාත්‍යන්තර ප්‍රතිසංස්කරණ සහ සංවර්ධන බැංකුවෙන් ලෝනයක් ද, ප්‍රතිපාර්ශ්වීය අරමුදල්වලින් ලබාගැනීමෙන් ද (චීනයෙන් සහ කැනඩාවෙන්) හාල් සහ පිටි පරිත්‍යාග ද, ප්‍රාග් ධන භාණ්ඩ නිර්මාණය සහ උපකරණ වශයෙන් එක්සත් සමාජවාදී සෝවියට් රුසියාවෙන් කෙළින්ම ලැබෙන විදේශාධාර ද ඇස්තමේන්තුවලට ඇතුලත්වේ.

## (ඇ) ජාත්‍යන්තර ගනුදෙනු හා විදේශීය වත්කම්

1960 පිළිබඳ ලංකාවේ ජාත්‍යන්තර ගනුදෙනු ගිණුම් 2 වැනි පරිශිෂ්ටයේ 25 (අ) (ආ) (ඇ) යන සංඛ්‍යා සටහන් වලින් දැක්වේ. 1959 වර්තන ගිණුම් ගනු දෙනු වල 1959 දී රුපියල් කෝටි 20.8 ක හිඟයක් වූ අතර, මේ හිඟය 1960 දී තාවකාලික සංඛ්‍යා අනුව රුපියල් කෝටි 21.0 ක් විය. 1960 වර්තන වියදමෙහි නො කඩවා හිඟයක් පැවැති සිව් වැනි වර්ෂය විය. 1960 වර්තන ගනුදෙනු ශෙෂය තවදුරටත් සුළු වශයෙන් පිරිහුනේ ආයාත ගෙවීම්වල වැඩිවීම නිසා, වෙළෙඳ භාණ්ඩ ගිණුමෙහි හිඟය වැඩි වූ බැවිනි. 1959 දී වෙළෙඳ භාණ්ඩ ගිණුමෙහි ඇති වූ හිඟය රුපියල් කෝටි 8.1 ක් වූ අතර 1960 දී එය රුපියල් කෝටි 9.4 ක් විය. එසේ වුවද, අදෘශ්‍ය ගනුදෙනුවල ශේෂයෙහි මඳ දියුණුවක් ඇති විය. එහි හිඟය රුපියල් කෝටි 12.7 සිට රුපියල් 11.5 දක්වා අඩුවිය.

අදෘශ්‍ය ගිණුම්හි පුනරාවර්තන හිඟයක් ඇතිවීම ලංකාවේ ගෙවුම් ශෙෂයන්හි සාමාන්‍ය අංගයක් විය. නිර්යාත ඉපැයුම් උච්චාවචනයන්ට භාජන වන හා අදෘශ්‍ය ගිණුමෙහි පුනරාවර්තන හිඟයක් තිබෙන රටක වෙළෙඳ භාණ්ඩ ගිණුම් ශෙෂය පැවතිය යුතු හේතුවාදී ක්‍රමය වනුයේ නිර්යාත ඉපැයුම් වැඩි වන විට ගිණුමෙහි විශාල අතිරික්තයක් ඇතිවීමත්, නිර්යාත ඉපැයුම් අඩුවන විට එහි සුළු අතිරික්තයක් හෝ හිඟයක් ඇතිවීමත්ය. එසේ වුව ද, 1959 හා 1960 විශාල වෙළෙඳ භාණ්ඩ හිඟයක් ඇති වූයේ, ඊට නුදුරු පසුගිය වර්ෂවලට වඩා, නිර්යාත ඉපැයුම් වැඩිව සහ ආයාත මිල අඩුව තිබිය දීය. තේ මිල තියුණු ලෙස වැඩි වූ 1955 දී හැර නිර්යාත ඉපැයුම් වෙන කුමන අවුරුද්දකදීටත් වඩා 1960 දී වැඩිව පැවැතිණි. 1959 දී ද නිර්යාත ඉපැයුම් එතරම් අඩු නොවීය. 1959 හා 1960 වර්ෂවල ආයාත මිල 1950 සිට 1960 දක්වා වූ දශකය තුළ පැවැති ආයාත මිලට වඩා සියයට 6 කින් අඩු විය. 1959 හා 1960 වෙළෙඳ ගිණුම්හි හිඟය ඇතිවීමට හේතු වූ ආයාත ගෙවුම්හි නො කඩවා වැඩිවීම වූ කලී ප්‍රධාන වශයෙන් ආණ්ඩුවේ අය වැය හිඟයන්ගෙන් උද්ගතවූණු අර්ථ ක්‍රමයේ ඇති වූ උද්ධමන බලවේගය නිසා ඉදුරා ඇති වූ ප්‍රතිඵලයකි.